සන්නස SANNASA

## ලියා දන්වන වග

**ආර්ථිකමය හා සමාජමය වශයෙන් පසුගිය වසර හැත්තෑ දෙකක් තිස්සේ විශාල පරිහානියකට පත්ව ඇති ශ්‍රී ලංකාවේ ජනතාවට දී ඇති අලූත් ම බලාපොරොත්තුව උගතුන් පාර්ලිමේන්තුවට යැවීම ය .ඒ අත්හදා බැලීමත් හොඳය. හොරුන් තක්කඩියන් පාර්ලිමේන්තුවෙන් එලවා දැමීම ඉතා වැදගත් වේ. හොරකමක් කළ සැණින් පාර්ලිමේන්තුවෙන් නෙරපා හැරීමට ඇති නීති රීති දැඩි ලෙස ක්‍රියාත්මක කිරීමට අනුබල දෙන අලුත් මන්ත්‍රී මණ්ඩලයක් පත් වේවා යැයි අපි ප්‍රාර්ථනා කරමු.**

**මේ තරම් ස්වාභාවික සම්පත්වලින් හෙබි ඉතා යහපත් දේශගුණයක් පවතින්නාවූ ශ්‍රී ලංකාව ලෝකයේ ඉහළම තැනට ඔසවා තැබීමට නොහැකි වීමට වගකිව යුත්තේ කවුරුන්ද යන්න සොයනවාට වඩා මෙතැන් සිට හෝ හරි පාරේ රට ගමන් කරවන ලෙස අලුතින් පත්වන ඇත්තන්ගෙන් අපි ඉල්ලා සිටිමු.**

**සංස්කරණය / Editor**
චිත්‍රාන් මොරකන්දෙ ගමගේ

අනුශාසක / **Advisor**
දෙනගම සිරිවර්ධන මහතා

**රූ රටා**
අතුල කල්දෙමුල්ල

**සේයා රූ**
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
ලක්‍ෂමන් කොඩිතුවක්කු
චික ධර්මබන්ධු
මහින්ද දිසානායක දිවුල්ගනේ
හර්ෂ කසුන්
ශනිල්ක නදීශාන්
ප්‍රසාද් විජයබන්දු

**ග්‍රැෆික් නිර්මාණ කරනය**
**Graphic Design by**
**Crystal D** Digital Agency
www.crystald.com.au

**සම්බන්ධීකරණය**
**New South Wales**
ලක්‍ෂමන් කොඩිතුවක්කු
**Queensland**
ආනන්ද සමරතුංග
**Canberra**
අසෝක නිමලසිරි

**වෙළඳ දැන්වීම් / Advertising**
**Prasad : 0413 201 590**
info@sannasa.com.au
www.sannasa.com.au

**Sannasa Bank Account Details**
**Acc Name:**
Sannasa Media Group
**BSB:** 033 137 **AC:** 626 670

සන්නස පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා, ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සළකන්න.

# ආලින්දය



අද ආලින්දයට කැඳවාගෙන එන්නේ ලංකාවට විශාල විදේශ විනිමයක් ලබා දෙන පසුගිය දිනවල මහත් ආන්දෝලනයකට ලක්වූ ඇවන්ගාඩ් සමූහ ව්‍යාපාරයේ සභාපති නිශ්ශංක සේනාධිපති මහතා,

**සන්නස:** ආයුබෝවන් සේනාධිපති මහත්මයාණනි! අප මුලින්ම කැමති ඔබෙන් දැන ගන්නට ඔබේ කුඩා කාලය සම්බන්ධව.

**සේනාධිපති:** මහතා මගේ අම්මගේ ගම මහනුවර මැණික්හින්න. තාත්තා කුලියාපිටියේ පන්නල. මම ඉපදුනේ කොට-හේනේ ජින්තුපිටිය කියන ප්‍රදේශයේ. පොඩි කාලෙ හැදුණෙ හංවැල්ල නගරයේ. මගේ තාත්තා පොලිස් නිලධාරියෙක්. එතුමා විශ්‍රාම ගියේ සාජන් මේජර් වරයෙක් හැටියට. මම පාසල් ගියේ කොළඹ ඉසිපතන මහා විද්‍යාලයට.මම සාමාන්‍ය පෙළ සමත්වෙලා උසස් පෙළ විභාගයට වාණිජ විෂයයන් ගෙන් ඉගෙන ගත්ත. ඒත් මම විභාගයට ලිව්වෙ නෑ මට හමුදාවට බැඳෙන්න උවමනා වූ නිසා. 1984 වෙනකන් මම පාසල් ගියා. පාසැල් කාලයෙදි මම ගොඩක් දඩබ්බරයි. කවුරුත් කියන එකක් අහන්නේ නෑ. අපේ පන්තියේ හිටියෙ ගොඩක් සල්ලිකාර පවුල් වල පුත්තු. පාසල් කාලයේ මම ගොඩක් ක්‍රීඩාවලට යොමු වුණත් ගෙදර තිබුණු අගහිඟකම් නිසා ට අවශ්‍ය බූට් සපත්තු ආදිය ගන්න සල්ලි තිබුණෙ නැහැ. පස්සේ මම කෙඩෙට්න් කළා. බාලදක්ෂ ව්‍යාපාරයේ වැඩකළා. මම රගර් ටීම් එකටත් ගියා. පැසිපන්දු ක්‍රීඩා කළේ අනුන්ගේ සපත්තු දෙකක් ඉල්ලගෙන. මට නොයෙක් වර හිතිච්ච දෙයක් තමයි මේ තත්ත්වයෙන් ගොඩ එන්න ඕන කියලා. ඒ වගේම දුප්පත් පවුල්වල අයට උදව් කරන්න ඕන කියලත් හිතුනා. පස්සේ මම කල්පනා කළා උප පොලිස් පරීක්ෂකවරයෙක් විදියට පොලිසියට බැදෙන්න. ඒත් අපේ තාත්තා සාජන් මේජර් නිසා ඒකට මට ඉඩ දුන්නේ නෑ. 1983 යුද්දෙදි අජිත් පෙරේරා කියලා මගේ හොඳම යාළුවගේ තාත්තව ඝාතනය වුණා චාවකච්චේරියේදී . එදා මගේ යාළුව හොඳටම ඇඬුවා. ඒක මට දරාගන්න බැරි විශාල කම්පනයක් ගෙන දුන්න. ඊට පස්සේ මම හිතුවා ආමි එකට බැඳෙන්න ඕන කියලා. පස්සෙ මම ගොඩක් මහ-න්සි උනා ඉංග්‍රීසි ඉගෙන ගන්න. ඒ කාලෙ තිබුන "වුමන්'' කියලා ඉංග්‍රීසි පත්තරයක්. මං ඕක හයියෙන් කියවනවා කට හුරු වෙන්න. පස්සේ මම හොඳට ඉංග්‍රීසි ඉගෙන ගෙන පොලිසියේ ඉන්ටවි හත අට ගිහිල්ලා හොඳ අවබෝධයක් ලැබුවා, මොකක්ද මේ සාමාන්‍ය දැනීම කියන්නේ කියලා. ඔය කාලේ අපේ ගෙයක් හදමින් තිබුණ . ඒ ගෙදර සිමෙන්ති බදාම ඇනුවේ, කළුගල් බැන්දේ,අත් වැඩේ කලේ මම. මගේ ගෙදර වයරිං කෙරුවෙත් මම. මේ සඳහා මම වයරින් පාඨමාලාවක් කරල ඉගෙන ගත්ත. මම පස් දෙනකුට කන්න උයල දීල ඒ අයට වැලි ඇදලා ගල් ඇදලා මේ වැඩ පිළිබඳ හොඳට ඉගෙන ගත්තා.

මම එක දවසක් දැක්කා බිම වැටිච්ච පත්තරයක තියෙනවා "මේ හිස් වැස්ම ඔබට ගැලපේදැයි බලන්න'' කියලා දැන්වීමක්. මම ඒක අරගෙන බලපුවහම ඒකෙ තියෙන්නෙ හමුදාවට යන්න සුදුසුකම් අඩු කරපු දැන්වීමක්.මොකද ඒ දවස්වල යුද්ධය නිසා හමුදා නිලධාරීන් විශාල ලෙස මිය යනවා. මේ නිසා හමුදාවට බැඳෙන්න තරුණයින් ඉදිරිපත් වන්නේ නෑ. ඒ නිසා තමයි සුදුසුකම් අඩු කරල තියෙන්නෙ. පස්සේ මම ඒකට අයදුම්පතක් යොමුකරලා අම්මගෙන් උදව්වක් ඉල්ලුවා. අම්මා මුලින් අකමැති වුණත් ජෙනරාල් පරණගමගේ නෝනා ගාව අම්මා වැඩ

10 වන පිටට